දුටු නොදුටු

# හෝ ගානා පොකුණ



Noble park community center හිදී දෙසැම්බර් 9වෙනිදා සවස ''හෝ ගානා පොකුණ'' චිත්‍රපටියේ දර්ශන වාරයක් සහ ඒ පිළිබඳ කතා බහක් වන බවට වූ දැන්වීම දැකීමෙන් පසු යටපත්ව තිබූ මතකයක් නැවත අවදිවිය. මම මේ චිත්‍රපටිය නරඹා දැන් වසරකටත් වැඩිය. ඉන් හෝරා කිහිපයකට පසු චිත්‍රපටියේ දැකගත් ඉස්කෝලය බඳු ඉසකෝලයක් හැබැහින් දැකගැනීමේ අවස්ථාවද මට ලැබිණි. ඒ පිළිබඳව එදා මම මගේ ෆේස් බුක් පිටුවෙහි මෙසේ සටහනක් තැබුවෙමි.

''හෝ ගානා පොකුණ'' කලෙකට පසු දැකගැනීමට ලැබුණු බෙහෙවින් ආකර්ශණීය ළමා චිත්‍රපටියකි. විදෙස් චිත්‍රපට උළෙල කිහිපයකින් විවිධ සම්මානයන් පවා හිමිකරගැනීමට සමත්ව ඇති එහි ළමා රංගනයකට හොඳම රංගනයට හිමි සම්මානයක්ද ලැබී ඇති බව ප්‍රචාරක පුවරුවක දක්නට ලැබිණ. එහෙත් සිනමා රසිකයෙකු ලෙස එම චිත්‍රපටියේ මගේ වෙසෙස් ආකර්ශණයට ලක්වූ චරිතය වූයේ ගුරුවරියගේ චරිතයයි. එහි ඇති ආකර්ශණීය ගති ලක්ෂණවලට සැබෑ ජීව ගුණය එක් කිරීමට චරිතය නිරූපනය කරන රංගන ශිල්පිනිය අනසුයා සුබසිංහ සමත්ව තිබිණ. උඩුගම් බලා පිහිනන ගුරුවරිය චිත්‍රපටිය අවසානයේ සිය සිසු දරුවන්ට හෝ ගානා පොකුණ පෙන්වන්නට සමත්වීම තුළින් චිත්‍රපටය ආන්තික සමාජ තීරුවේ දරු දැරියන්ගේ ධනාත්මක චින්තයද ප්‍රවර්ධනය කරන සුළුය. දරු දැරියන්ටත් වඩා මෙම චිත්‍රපටිය වැඩිහිටියන් සඳහා සුදුසු චිත්‍රපටියකැයි මට සිතේ.

එම චිත්‍රපටිය නැරඹීමෙන් හෝරා කිහිපයකට පසු මම මේ විද්‍යාල භූමියට පය තැබිමි. මෙහි සිසු දරු දැරියෝද රොකට් එකක් නොමැතිව හඳට යන්නට වෙර දරමින් සිටියහ. එහෙත් හෝ ගානා පොකුණේ විදුහල්පතිවරයාද ගුරුවරියද මෙහි නොවීය. ගුරුවරියගේ භූමිකාවට පණ පොවමින් රොකට් එකක් නැතිව දරු දරියන් හඳට යැවීමේ සිහින පුබුදුවමින් එහි සිටියේ වෙනස් ආකාරයේ විදුහල්පතිවරයෙකි.



ශ්‍රීලාල් සෙනෙවිරත්න



එහෙත් එහිදී හෝ ගානා පොකුණේ ගුරුවරිය මෙන්ම මේ විදුහල්පතිවරයාද අසරණව සිටියේය.

විද්‍යාලය, දේවහුව කොළණියේ, ඉහළ දිග්ගල ප්‍රාථමික විද්‍යාලය යි. මෙහි නව වසරේ පළමු පන්තියට ළමයින් ඇතුළත් කරගත්තද පන්තිය පටන් ගැනීමට නොහැකිය. ඒ, 'අ' යන්න කියන්න පාසල් බිමට පය තබන පොඩිවුන්ට අවශ්‍ය මූලික පහසුකම් කිහිපය හෝ විද්‍යාලය සතුව නොමැතිකමිනි.

යහපාලන ආණ්ඩුවේ පළමු අයවැයෙන් අධ්‍යාපනය සඳහා රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 6%ක් වෙන්කර ඇති බව මුදල් ඇමැතිවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කර තිබුණද මේ විද්‍යාලයේ පළමු පන්තියට සිසුන් පහළොවක් විස්සක් ඇතුළත් කර ගැනීමට අවශ්‍ය ඩෙස් පුටු ස්වල්පය හෝ ලැබී නොමැත. එබැවින් ඇතුළත් කරන දරුවන් සඳහා ඩෙස් පුටු හදාගෙන ඒමට දෙමාපියන්ට සිදුව ඇත. පන්තිය පටන් ගැනීමට අවශ්‍ය අවම අවශ්‍යතාව ද සම්පූර්ණ වී නැත්තේ එලෙසිනි.

මේ විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කිරීමට අයදුම් කොට ඇත්තේ ගමේ අවට පදිංචි ගොවි කම්කරු පන්තියේ පවුල්වල දරුවන්ය. ඇති-හැකි පවුල්වල දරුවන් අවට ඇති ''ජනප්‍රිය වෙමින් පවතින'' පාසල් විසින් සාදරයෙන් පිළිගෙන ඇත. ඒ මජර පාසල් සංස්කෘතියෙන් බැහැර කරනු ලැබූ ආර්ථික දුෂ්කරතා සහිත පවුල්වල දරුවන්ට නිදහස් අධ්‍යාපනයේ අවමය ලබන්නට ශේෂවී ඇත්තේ මේ සීමිත බිම් කඩ පමණි.

පළමු වසර සඳහා පන්ති කාමරයක් වෙන් කොට ඇත. දෙමාපියෝ එහි බිත්තිවල සායම් ගා තිබුණද බිම පාට ගා තිබුණේ අඩක් පමණකි. විදුහල්පතිවරයා පැවසුවේ සායම් ගෑවේද දෙමව්පියන්ගේ මුදලින් බවත්, බිම සම්පූර්ණයෙන්ම ගෑමට සායම් ටින් එකක් පමණ මදිවූ බවත්ය.



විදුහල් භූමියේ නටඹුන් වූ කුඩා ළමා උයනකි. එහි සීසෝවක් සහ ඔන්චිල්ලා දෙකක් ඇතත් ඒ දෙකම කැඩී ගොසිණි. රුපියල් විසිතිස් දහසක් වැය කළ හොත් මෙම නටඹුන් උයන මුළුමනින්ම ප්‍රතිසංස්කරණය කරගැනීමට වුවත් දෙමව්පියන්ට එතරම් මුදලක් ලබාදිය නොහැකි බව විදුහල්පතිවරයා කීවේය. ඒ අඩුව පුරවන්නට අවට කැලයෙන් කපාගෙන ආ දැව දඬු යොදාගනිමින් ළමයින්ට පාසල් පරිශ්‍රයේ සෙල්ලම් ගෙයක් හදමින් තිබිණ.



වර්තමානයේ රට තුළ ක්‍රියාත්මක වන මජර පාසල් සංස්කෘතියෙන් පාරාජිකා වූ පාසලක් වුවද මේ පාසල ආරම්භ කොට ඇත්තේ 1960 වසරේදී තරම් ඈතකය. ආරම්භයේදී 8 වන වසර දක්වා පන්ති පැවැත්වුවද මජර පාසල් සංස්කෘතියේ ව්‍යාප්තියත් සමඟ මේ පාසල ප්‍රාථමික විද්‍යාලයක් දක්වා පහළට තල්ලු වී ඇත. එහෙත් අදටත් පහ වසරේ ශිෂ්‍යත්ව විභාගයෙන් ළමයෙක් දෙදෙනෙක් වාර්ෂිකව සමත් කරන්නට පාසල සමත්ව සිටින්නේ විදුහල්පතිවරයා සහ ගුරුවරුන්ගේ කැපවීම මතය. එය හෝ ගානා පොකුණේ දරුවන් අවසානයේ රොකට් එකක් නැතිව හඳට යාම හා සමානය.

''පැය දෙකක සංගීත සංදර්ශනයකටත් රුපියල් පනස් දාහක් දීලා ටිකට් අරගෙන යන්න පුලුවන් අය කොළඹ සමාජයේ ඉන්නවානේ. බැරිද කාට හරි කියලා මේ ඔන්චිල්ලා දෙකයි සී සෝවයි හදලා දෙන්න ? ටික දවසකට හරි පොඩි දරුවන්ට සෙල්ලම් කරන්න ?''

කෙටි පිළිසඳරකින් පසු විදුහල්පතිවරයා මා විමසුවේය.

ඒ ප්‍රශ්නය එලෙසින්ම ඔබ වෙත යොමු කරමි. ඔබට යමක් කළ නොහැකි නම් ඔබගේ සහෘදයන් වෙත මේ සටහන යොමු කරන මෙන් ඉල්ලමි. 071-5949718/077-9472415 දුරකථන අංකවලින් විදුහල්පති මුණවීර මහතා අමතා ඔබට වැඩිදුර විස්තර විමසිය හැකිය. කළ හැකි ආධාරයක් කළ හැකිය.

අඩුම තරමින් අඩක් තීන්ත ගෑ පන්ති කාමරයේ බිම ඉතිරි අඩ ගෑමට තීන්ත ටින් එකක් හෝ ප්‍රදානය කරන්නට ඔබට හැකි නම් එය කෝටි ගණනක් සේ මේ පාසල් දරුවන්ට දැනෙනු ඇත.

**මම මේ සටහන ෆේස් බුක් පිටුවෙහි තබන විට මේ විදුහලේ පළමු වසරට ඇතුළත් වීමට ඩෙස් බංකු කරගසාගෙන පැමිණි දරු පැටවුන් දැන් දෙවන වසරේය. ලබන මාසයේ එවැනිම තවත් දරු පැටවුන් රංචුවක් මෙහි පැමිණීමට පේවෙමින් සිටිති. නටඹුන් ළමා උයන අදටත් එපරිද්දෙනි.**